# ECHO OF HIS CALL

# කැඳවීමේ ප්‍රතිරාවය

SINHALA

ECHO OF HIS CALL 1969-2019 GOLDEN JUBILEE

REACHING NATIONS

India's National Spiritual Newspaper

₹ 10/-

Published monthly in ENGLISH, TAMIL, MALAYALAM, TELUGU, HINDI, KANNADA, MARATHI, BENGALI, GUJARATI, ODIYA, ASSAMESE, PUNJABI, NEPALI, URDU, SINHALA & AFRIKAN

Editor : S. SAM SELVA RAJ

16 Languages

Vol. XIX | YEAR OF OUR LORD JESUS CHRIST, 2025 JANUARY | Issue No. 02


## ශුද්ධවූ බයිබලය

### (ගීතාවලිය 101:1-8)

01. කරුණාවද යුක්තියද ගැන ගී කියන්නෙමි. ස්වාමිනි, ඔබට ප්‍රශංසා ගී කියන්නෙමි.

02 නුවණැතිව නිර්දෝෂ මාර්ගයක හැසිරෙන්නෙමි. ඔබ කවදා මා වෙත එනසේක්ද? මම නිදොස් සිතකින් මාගේ ගෙයි හැසිරෙන්නෙමි.

03. මාගේ ඇස් හමුයෙහි කිසි නීච දෙයක් තබා නොගන්නෙමි. ඉවතට හැරෙන්නන්ගේ ක්‍රියාව නුරුස්සමි; එය මට නොඇලෙන්නේය.

04. මුරණ්ඩු සිතක් මා කෙරෙන් දුරුවන්නේය. නපුරු දෙයක් දැන නොගන්නෙමි.

05. යමෙක් ස්වකීය අසල්වාසියා ගැන රහසේ කේලාම්කියයිද ඔහු විනාශකරන්නෙමි. උඩගු බැල්මක් හා ආඩම්බර සිතක් ඇත්තා නොඉවසන්නෙමි.

06. දේශයේ විශ්වාසකටයුතු අය මා සමඟ වසන පිණිස ඔවුන් කෙරෙහි මාගේ ඇස් යොමා තිබෙන්නේය. නිර්දෝෂ මාර්ගයෙක්හි හැසිරෙන තැනැත්තේම මට මෙහෙකරන්නේය.

07. වංචාකරන කිසිවෙක් මාගේ ගෙයි නොවසන්නේය; බොරුකියන කිසිවෙක් මාගේ ඇස් හමුයෙහි පිහිටුවනු නොලබන්නේය.

08. අයුතුකම් කරන සියල්ලන් ස්වාමීන්ගේ නුවරින් සිඳ දමන පිණිස දේශයේ සියලුරැ දුෂ්ටයන් උදයක් පාසා විනාශකරන්නෙමි.

## ඔබට දුන් පොරොන් දු යේසුස් ක්‍රිස්තුස් වහන්සේ සිහි කරන සේක!

THE LORD JESUS CHRIST WILL REMEMBER HIS PROMISES TO YOU!

(ප්‍රධාන කර්තෘ දේවගැති ඒන්ජලින් සෙල්වකුමාරි)



කැඳවීමේ ප්‍රතිරාවය පවුලේ සැම දෙනාටම සුභ නව වසරක් වේවා! කියා මා ප්‍රාර්ථනා කරමි.

මෙම නව වසරේදී මගේ යාච්ඤාව නම්, දෙවියන් වහන්සේ ඔබ ගැනද ඔබගේ පවුල ගැනද ඔබ උන්වහන්සේ උදෙසා කරන යහපත් සේවය ගැනද මතකයේ තබාගෙන ඔබට ආශිර්වාද කරයි.

දේව වචනය අපට පවසන්නේ, අපගේ දෙවියන්වහන්සේ පොරොන්දු රකින්නාවූ දෙවියන්වහන්සේ බවයි. ස්වාමීන් වහන්සේ මෙසේ පවසන සේක; ***"....මක්නිසාද මා විසින් නුඹට කී දෙය සිදුකරන තුරු නුඹ අත් නොහරිමි." (උත්පත්ති 28:15)*** දෙවියන් වහන්සේ අපට පොරොන්දුවක් දුන් විට උන්වහන්සේ එය ඉෂ්ට කිරීමටද විශ්වාසවන්තයි. උන්වහන්සේ නිසි වේලාවට එම පොරොන්දු ඉෂ්ට කරන සේක. උන්වහන්සේගේ පොරොන්දුව ඉෂ්ට වීමට දිනක් හෝ සතියක් හෝ මාසයක් හෝ වසරක් හෝ තවත් කාලයක් බලා සිටීමට සිදුවූවත් එම පොරොන්දුව ඉටුවීමට ප්‍රමාද වූවත් උන්වහන්සේගේ එම පොරොන්දුව ඒ ආකාරයෙන්ම ඉටුවෙනවා ඇත.

මාගේ යාච්ඤාව නම්; 2025 නව වසර තුළදී දෙවියන් වහන්සේගේ පොරොන්දුව ඔබගේ ජීවිතයෙහි නියමිත වේලාවේදී ඉෂ්ට වෙන්නා වූ වසරක්

*3 වෙනි පිටුවට ...*




Echo of His Call

*Christian YouTube Channel!*

**An opportunity to pray with Pr. S. Sam Selva Raj!**

Message & Prayer in 5 minutes!!

**English, Hindi, Tamil & Telugu**

Every day – From 2.00 A.M.


**Tamil Sunday Service – 8.30 A.M.**

★ Please Subscribe and Share ★

ECHO OF HIS CALL - (1969-2019 GOLDEN JUBILEE YEAR)

REACHING NATIONS

## from your dearly beloved brother...





**OUR MISSION POLICY**

We should expound and teach the contemporary generation the undiluted teachings of the ancient and early Apostles. It is the need of the hour.

HON. EDITOR-IN-CHIEF
Rev. Angeline S. Kumari, M.A., M.Sc., M.Ed.
HON. MANAGING EDITOR
Pastor Alex Samson Sam, B.Th., M.Div.
GENERAL MANAGER
Bro. N. Prakasam, M.A., M.Sc.(C&P), PGDHRM., MBA.
ADMINISTRATION
Sis. Jesy Veena Sam
Adv. K. Puratchivendan, M.Com., C.A., B.L.
Dr. P.E.R. Premchand, M.Sc., M.A., M.Ed., Ph.D.
Dr. C.G.S. Baburao, B.Tech., M.Tech. (DM), Ph.D.
Dr. Rabinder Boaz, M.S. (CMC)
EDITORIAL BOARD
Dr. Serena Bevin, M.A., M.Phil., B.Ed.
Sis. Sajini Cherian
Rev. Dr. K.R. Rajasekaran
Rev. Dr. William Robert, Ph.D., DD, D.Lit.
EDITOR, PUBLISHER & PRINTER
Pastor S. SAM SELVA RAJ
Echo of His Call Printers
10, Mohammed Abdullah 2nd Street,
Chepauk, Chennai- 600 005, India.
Phone : (+ 91- 44) 2852 8282, 2852 9293, 2854 7766
Cell : (+91) 98410 71852, 98412 71858
95661 31858
E.MAIL
sam@echoofhiscall.org
biblecor@yahoo.co.in
WEBSITES
www.echoofhiscall.org
www.stpaulsmatriculation.com
YOUTUBE CHANNEL
Echo of His Call

"එවිට නුඹේ අටු බොහෝ ධාන්‍යයෙන් පිරෙන්නේය, නුඹේ මුද්‍රික යන්ත්‍රද අලුත් මුද්‍රික පානයෙන් ඉතිරෙන්නේය." (හිතෝපදේශය 3:10)

**ක්‍රිස්තුස්වහන්සේ තුල ප්‍රේමවන්තයෙනි,**

අපගේ ආදරණීය සුභ පැතුම් ඔබට ගෙනෙමි! ඔබගේ ආරක්ෂාව සහ ඔබගේ සුබසාධනය උදෙසා අපි දිනපතාම ඔබ වෙනුවෙන් යාඥා කරමු. ඔබ අප වෙනුවෙන් කරන්නා වූ සෑම යාඥාවන් නිසාත් සියලු උපකාරයන් නිසාත් පසුගිය වසර පුරාම අප සමඟ සිටගත් නිසාත් අපි ඔබට ස්තුති කරන අතර ඔබ සියලු දෙනාම සුවයෙන් සිටී යයි කියා සිතමු.

පසුගිය වසර පුරාවටම අපගේ සේවා ගමන දෙවියන් වහන්සේගේ යහපත්කමින් පිරී තිබුණි. එසේම යොර්දාන් ගඟක් මෙන් බාධාවන් ද රතු මුහුද මෙන් වේදනාවන් ද අප කරා පැමිණුනත් ඒ සියලු දෙයම දෙවියන් වහන්සේගේ බලය කරණ කොටගෙන ජය ගැනීමට උන්වහන්සේ අපට ලබා දුන් කරුණාව නිසා අපි උන්වහන්සේට ස්තුති කරමු.

මෙවැනි වූ අත්දැකීම් ඔබගේ ජීවිතයේ ද තිබෙනවා ඇත.බිය නොවන්න; ස්වාමීන් වහන්සේ ඔබ උදෙසා සටන් කරන සේක! ඔබ සමග උන්වහන්සේ සිට ගනිමින් ඔබගේ සෑම දේටම උපකාර කරන සේක. *''මක්නිසාද නුඹලා හුළඟවක්වත් වැස්සවත් නොදකින නමුත් නුඹලාටත් නුඹලාගේ සිවුපාඋන්ටත් නුඹලාගේ මෘගයන්ටත් බීමට මේ මිටියාවත වතුරෙන් පිරෙනවා ඇතැයි ස්වාමීන් වහන්සේ කියන සේක.'' (2 රාජාවලිය 3:17)*

*''ඒ නිසා ස්වාමි වූ දෙවියන් වහන්සේ මෙසේ කියන සේක: බලව, මම අත්තිවාරමක් පිණිස ගලක් එනම් පරීක්ෂා කරන ලද ගලක්, සවි අත්තිවාරමක් වූ අනර්ඝ කොනේ ගලක් සියුම් සියුම් හී තබමි.'' (යෙසාය 28:16)* එබැවින් ඔබ කනස්සල්ලට පත් නොවන්න. දෙවියන් වහන්සේ ඔබට හාස්කම් කරන සේක. කඳු පහ වන්නේය. ජීවිතයේ තිබෙන්නා වූ සියලු පර්වත දෙවියන් වහන්සේ මුහුදට පෙරළා දමන සේක. උන්වහන්සේගේ කරුණාව ඔබගෙන් අහක්ව නොයන සේක. *''මක්නිසාද කඳු පහව යන්නේය, හෙල්ද සොලවනු ලබන්නේය; නමුත් මාගේ කරුණාව නම් නුඹෙන් පහ නොවන්නේය, මාගේ සමාදාන ගිවිසුමද ද සොල්වනු නොලබන්නේ යැයි නුඹට අනුකම්පා කරන ස්වාමීන් වහන්සේ කියන සේක." (යෙසායා 54:10)* වෙනස් නොවන්නා වූ ස්වාමීන් වහන්සේ ඔබ හා සමග සිටිමින් මේ වසර අවසානයට පෙර උන්වහන්සේගේ සියලු යහපත්කම් ඔබට ලබා දෙන සේක.
අපගේ බලය ස්වාමීන්වහන්සේ දවසින් දවස වැඩි කරන සේක. අපව වැටෙන්නට ඉඩ නොදෙන සේක. උන්වහන්සේ අපව ඔසවා තබන සේක.

*''මක්නිසාද ධර්මිෂ්ඨයා සත් වරක් වැටුණත් නැගිටින්නේය; නමුත් දුෂ්ටයෝ විපත්තිය කරණකොටගෙන වැටී යන්නෝමය." (හිතෝපදේශය 24:16)* එමනිසා අප අධෛර්යයට පත් නොවෙමු. ස්වාමීන් වහන්සේගේ බලය අපව ශක්තිමත් කරයි. කැඳවීමේ ප්‍රතිරාවය සේවය සඳහා ඔබගේ යාඥාවත් ඔබගේ උපකාරයත් තවදුරටත් අප බලාපොරොත්තු වෙමු. දෙවියන් වහන්සේගේ දාසයන්ට උපකාර කිරීමට මැලි නොවන්න. ස්වාමීන් වහන්සේ ඔබට ආශිර්වාද කරන සේක.

අපි ඔබ සියලු දෙනාටම සුභ නව වසරක් වේවා! කියා ප්‍රාර්ථනා කරමු.

**යෙසුස කුසතුසවහනසෙ තුල ඔබගෙ සෙවක**

*Pr. Alex Samson Sam*

*Pr. S. Sam Selva Raj*

(+91) 98412 71858 / 98410 71858, E.mail : sam@echoofhiscall.org

Our Ministries: ECHO OF HIS CALL Monthly Magazines (16 languages) BIBLECOR - Postal Courses (3 languages) YouTube Ministry Online Courses Theological Correspondence Courses (2 languages) Church Planting Nehemiah Bible Colleges Gospel Printing Press Great Commission Partners St. Paul's Matriculation School Crusades Community Development

## For Your Kind Attention!

Our 5 minute **Echo of His Call** YouTube messages are being broadcasted from 2.00 A.M. in Tamil, Telugu, English and Hindi (everyday). You can receive the Grace of God by watching the messages.

Moreover, save my mobile numbers (+91) 98410 71858, (+91) 98412 71858 (personal) in your mobile phones.

- Pr. S. Sam Selva Raj

*1 පිටුවෙන්....*

වේවා කියා ප්‍රාර්ථනා කරමි. ඔබගේ ප්‍රාර්ථනාව ඉටුවන පිණිස මා ඔබ උදෙසා මා යාච්ඤා කරමි!

### ඉතාම දුෂ්කර අවස්ථාවන්වලදී බලාපොරොත්තුවක් ඇති යාච්ඤාව

දෙවියන්වහන්සේ ඔබට පොරොන්දුවක් දුන් කල්හි ඔබ නොකඩවාම ඒ ගැන යාච්ඤා කළ යුතුයි. ඇදහිල්ලෙන් ඒ දේ ලැබෙන තුරු ඔබ යාච්ඤා කළ යුතුයි. නිතරම දුෂ්කර අවස්ථාවන්වලදී ඉතාම ඕනෑකමින් අපි යාච්ඤා කළ යුතුය. දේව වචනය පුරාවටම බොහෝ පුද්ගලයින්ගේ ජීවිතයේ දුෂ්කර අවස්ථාවන්වලදී ඔවුන් දෙවියන් වහන්සේ වෙතට හැරුණු විටදී උන්වහන්සේ ඔවුන්ට උත්තර දුන් බව අපට පෙනෙන්නා වූ කාරණයකි.

''දෙවියන්වහන්සේ ඔබ ගැන සිතනවා" යි කියා කියන විටදී එනම් අප යාච්ඤා කරන කල්හි අපගේ ඇදහිල්ල කරණ කොටගෙන අපගේ කනස්සල්ලට ස්වර්ගයෙන් පිළිතුරක් තිබේ. හන්නා තමාට දරුවෙක් නැතැයි කියා ඉතාම වේදනාවට පත් වූ කාන්තාවක්ය. හන්නා ***''මම දුක්බර ශෝක සිතක් ඇති ස්ත්‍රීයක්ය" කියා පැවසීය (සාමුවෙල් 1:15)*** ඇය යාච්ඤා කර ඇගේ හදවත ස්වාමීන් වහන්සේ ඉදිරියේ වැගිරූ විටදී ඇගේ තත්ත්වය වෙනස් විය. දේව වචනය පවසන්නේ; ***'හන්නාගේ මුහුණ තවත් මලානිකව නොතිබුණේය." කියාය. (1සාමුවෙල් 1:18)***



I am a woman who is deeply troubled - Hannah's Prayer

මන්ද දෙවියන්වහන්සේ ඇගේ යාච්ඤාවට උත්තර දුන්නාය කියා ඇය විශ්වාස කළාය. දේව වචනය පවසන්නේ ***''දෙවියන් වහන්සේ ඇයව සිහි කළේය." (1 සාමුවෙන් 1:19)*** උන්වහන්සේ ඇයට දරුවෙක් ලබා දුන් සේක.

තවත් බලවත් උදාහරණයක් නම් හෙසකියා රජතුමාට දෙවියන් වහන්සේ කතා කරමින් ඔහුගේ මරණයට සූදානම් වෙන්නේ කියා පැවසුවේය. හෙසකියාද ඉතාම දුකෙන් යාච්ඤා කළේය.

***''අහෝ ස්වාමීන් වහන්සේ මා සැබෑ කමිනුත් සම්පූර්ණ සිතකිනුත් ඔබ ඉදිරියෙහි හැසිර ඔබගේ ඇස් හමුවෙහි හරිව තිබුණු දේ කළ බව සිහිකළ මැනවයි කියා අතිශයින් ඇඬුවේය." (1 රාජාවලිය 20:3)*** ඔහු දුක්බරව මුළු හදවතින්ම කළ යාච්ඤාව දෙවියන්වහන්සේගෙ හදවතට දැනී උන්වහන්සේ ඔහුගේ ආයුෂ වැඩි කළේය.

බයිබලයේ මේ ආකාරයෙන් බොහෝ සාක්ෂිවලින් පිරී තිබේ. දුෂ්කර අවස්ථාවලදී කළ යාච්ඤාවන් වලට දෙවියන් වහන්සේගේ දිව්‍යමය පිළිතුරු බොහෝ අවස්ථාවන්වල සඳහන් කරයි. මනුෂ්‍යයන් යාච්ඤා කළ සෑම අවස්ථාවන්වලදීම දෙවියන්වහන්සේ ඔවුන්ව සිහි කළේය. පසුගිය වසරේදී ඔබ කොතරම් කල් දෙවියන් වහන්සේට මොර ගැසුවාද කියා මා නොදනිමි. සමහරවිටදී ඔබ මෙසේ පවසන්නට ඇත. ''එනම් ස්වාමීනි, මා ගැන අනුකම්පා කර මා ගැන සිතන්න, මා ගමන් කරන මේ දුක්බර අවස්ථාවේදී මා සිහිකරන්න" කියාය.

අද ඔබටත් මටත් ප්‍රීතිමත් දෙයක් තිබේ. සර්ව බලධාරී දෙවියන් වහන්සේ අද ඔබට මෙසේ පවසයි.

***''....... මාගේ කිසි වචනයක් තවත් ප්‍රමාද නොවී, මා විසින් කියන වචනයක් සිදු වන්නේමය කියා ස්වාමී වූ දෙවියන්වහන්සේ කියන සේක." (එසකියෙල් 12:28)***

මගේ හදවතින් මා කරන යාච්ඤාව නම් මේ 2025 වන නව වසරේදී දෙවියන් වහන්සේ ඔබව සිහි කරමින් උන්වහන්සේගේ සියලුම සැලසුම් ඔබගේ ජීවිතය තුළත් ඔබගේ පවුල තුලත් ඔබගේ සේවය තුළත් ඉටුවන්න කියාය.

අපව දෙවියන් වහන්සේ සිහි කරන්න ඕනේ කියා බලාපොරොත්තු වන ආකාරයට මෙම වසරේදී අපගේ ජීවිතයේ අප කළ යුතු ඉතා ප්‍රධාන වැදගත් දේ ගැන දෙවියන්වහන්සේ අපට මතක්කර දෙයි. ඒවායින් සමහර දේවල් ගැන අපි බලමු.

### (1). දෙවියන් වහන්සේගේ ක්‍රියාවන් හා හාස්කම් සිහිකරන්න.

***''ස්වාමීන්ගේ ක්‍රියා සඳහන් කරන්නෙමි; මක්නිසාද ඔබගේ පූරාණ ආශ්චර්යයන් සිහිකරන්නෙමි. ඔබගේ කර්මාන්ත සියල්ල ගැන භාවනාකරන්නෙමි. ඔබගේ ක්‍රියා ගැන මෙනෙහිකරන්නෙමියි කීයෙමි." (ගීතාවලිය 77:11- 12)***

දෙවියන්වහන්සේ අපගේ ජීවිතයේ කලා වූ සියලුම ආශ්චර්ය ක්‍රියාවන් හා ආශිර්වාදයන් අපට මතක් කරන්න කියා දේව වචනය පවසයි. මෙයට උදාහරණයක් ලෙස යෝෂුවා 4 වන පරිච්ඡේදය අපට බැලීමට හැකිය. යෝෂුවාගේ නායකත්වයෙන් ඉශ්‍රායල් සෙනඟ යෝර්දාන් ගඟ තරණය කළේය.



Israelites, under Joshua's leadership, crossed the River Jordan.

ඔවුන් එය තරණය කළ අවස්ථාවේදී දෙවියන්වහන්සේ ඔවුන්ට උන්වහන්සේගේ බලවත් ක්‍රියාවන් මතක් කරන පිණිස යමක් කරන්නේ කියා පැවසීය. එනම් යොර්දාන් ගඟෙන් ගල් ටිකක් ගෙන එයින් දෙවියන් වහන්සේගේ විශ්වාසවන්තකම මතක් කරන පිණිස තබාගන්නය කියා පැවසුවේය.

***''මෙසේ කරන්නේ ඒවා නුඹලා අතරේ සිහිවීම් ලකුණක් වන පිණිසය. මේ ගල් තිබෙන්නේ කුමටදැයි නුඹලාගේ දරුවන් මතු කාලයේ අසන විට නුඹලා ඔවුන්ට කතා කර ස්වාමීන්වහන්සේගේ ගිවිසුම් පෙට්ටිය ඉදිරියෙහි යොර්දානේ ජලය බෙදී ගිය නිසාය; පෙට්ටිය යොර්දානෙන් මෙතරට එන විට යොර්දාන් ජලය බෙදී ගියේය. මේ ගල්ද ඉශ්‍රායෙල් පුත්‍රයන්ට සදාකාල සිහිවීමක් පිණිස වන්නේයයි කියන්නැයි කීවේය.'' (යෝෂුවා 4:6-7)***

2024 වර්ෂයේ හෝ ඊට පෙර උන්වහන්සේ ඔබට කළ සෑම දේම ඔබට සිහිවෙනවාද? යෝර්දාන් ගඟ ඉදිරියේදී ඊශ්‍රායෙල් සෙනඟට අභියෝගයක් තිබුනේ නැතිනම් ඔවුන්ගේ පරම්පරාවට සිහිකිරීමට තබා ගැනීමට එය අවශ්‍ය වන්නේ නැත.

සමහර අවස්ථාවන් වලදී දෙවියන්වහන්සේ අපගේ ජීවිතයේ අභියෝගවලට මුහුණ දීමට ඉඩහරියි. ඒවා යොර්දාන් ගඟට සමානය. එවැනි අභියෝග අපට පැමිණෙන්නේ අපව ගොඩනැගීම පිණිසත් දෙවියන්වහන්සේ අපට කුමක් කල හැකිද කියා අපගේ ජීවිතවලට මතක් කර දීමටයි. එසේම එවැනි ක්‍රියාවන් අපගේ පරම්පරාවටද මතක් කර දෙන පිණිස ඒවා සිදුවේ.

## (2). ඔබගේ මැවුම්කාරයාව සිහි කරන්න. (දේශනාකාරයා 12:1)

නිතරම මෙම පදය කතා කරන්නට පාවිච්චි කරන්නේ තරුණ තරුණියන් උදෙසාය. ***''නුඹේ යෞවන දවස්වලදී නුඹේ මැවුම්කාරයා සිහිකරපන්න........" (දේශනාකාරයා 12:1)*** නමුත් මෙය තරුණයන්ට පමණක් නොවෙයි. ඊට වඩා සෑම කෙනෙකුගේම ජීවිතයෙහි මැවුම්කාරයා සිහි කරන්න කියා පවසයි.

බොහෝ අවස්ථාවන් වලදී අප මැවුම්කාරයාට වඩා මැවිල්ලට ප්‍රමුඛස්ථානය දෙයි. මේ සඳහා අපට බයිබලය අවවාද කරයි.

***''එසේ කළේ ඔවුන් දෙවියන් වහන්සේගේ සත්‍යය බොරුවකට මාරු කර මැවුම්කාරයාණන් වහන්සේට නොව මැවිල්ලට නමස්කාර කරමින් මෙහෙකළ නිසාය. උන්වහන්සේ සදාකල්ම ප්‍රශංසනීයව සිටින සේක. ආමෙන්.'' (රෝම1:25)***

අප නිතරම මේ ගැන නොසිතා මේ ලෝකයේ තිබෙන්නා වූ දේවල් වලට මුල් තැන දෙමින් ඒවා මැවූ මැවුම්කාරයාව අමතකව තිබේ. අපට දේව වචනය මතක් කර දෙන්නේ;

***''නුඹුත් පළමුකොට උන්වහන්සේගේ රාජ්‍යයද උන්වහන්සේගේ ධර්මිෂ්ටකමද සොයාපල්ලා; මේ සියල්ලත් නුඹලාට දෙනු ලබන්නේය." (මතෙව් 6:33)***

අපගේ ඇදහිල්ලේ කතෘවරයා සහ සම්පූර්ණ කරන්නා වන යේසුස්වහන්සේ දෙසම බලමින් අප යා යුතුයි. උන්වහන්සේ සියල්ල මැවූ නිසා අපගේ ජීවිතය සම්පූර්ණයෙන් පාලනය තිබෙන්නේ උන්වහන්සේගේ අතෙහිය. අපගේ ජීවිතයෙහි සිදුවෙන සෑම සිදුවීමක්ම දිව්‍යමය ලෙස සිදුවෙයි. මැවුම්කාරයා විශ්වාස කරන්න. උන්වහන්සේ ඔබගේ සියලුම කාරණාවන් යහපතට හරවයි.



**Jacob with his beloved son**

යෝසෙප්ගේ ජීවිත කතාව ආදර්ශයට ගන්න. ඔහු යාකොබ් ගේ ප්‍රියම පුත්‍රයාය. ඔහු මහලු වයසේ දී ඔහුට යෝසෙප්ව ඉපදුනේය. ඒ නිසා ඔහු ඔහුට අතිශයින් ප්‍රේම කළ නිසා ඔහුගේ සහෝදරයන් යෝසෙප් කෙරෙහි ඊර්ෂ්‍යාවක් ඇති විය. යෝසෙප් සිහින දකින්නෙක්ය. දෙවියන් වහන්සේගේ පොරොන්දු සහ අනාවැකි ඔහුට ලැබුණේය. එනම් දිනක් ඔහුගේ පවුලේ අය ඔහු ඉදිරියේ වැඳ වැටෙනවාය කියා ඔහු පැවසීය. නමුත් මෙය සිදු වෙන පිණිස යෝසෙප්ට නව මාර්ගයක ගමන් කිරීමට සිදුවෙනවාය කියා දෙවියන්වහන්සේ දැන සිටියේය. යාකොබ් කිසි විටෙක ඔහුගේ දරුවා මිසරයට යනවාට කැමති වූයේ නැත. නමුත් දෙවියන් වහන්සේට ඔහු ගැන වෙන සැලැස්මක් තිබුනි. එමනිසා යෝසෙප්ට අමාරු මාර්ගයක යාමට සිදුවිය. ඔහු පාළු වලක හා හිර ගෙදරක සිටිය නමුත් අවසානයේදී ඔහු රජ ගෙදරට ගියේය. ඔහුට විරුද්ධව සෝදිසි බොරු චෝදනාවන් හිරගෙදර අත්දැකීම් යන මේ සියල්ලේ දී ඔහුව දෙවියන්වහන්සේ සිහි කරමින් සෑම දේම උන්වහන්සේ විසින් පාලනය කළේය.



**Joseph had to walk a difficult path!**

....Contd. to page 6

GREAT COMMISSION PARTNERS
ECHO OF HIS CALL MINISTRIES
SINCE 1969

# යාච්ඤා පංගුකාර සේවයේ අයට යාච්ඤා ඉල්ලීම්

**බෙදා ගැනීම (ගලාති 6:2)**
**උපකාර කිරීම (රෝම 12:13) සහ**
**පුබුදු කිරීම (2 තිමෝති 1:6)**

## ස්තුති දීම හා ප්‍රසංශා කල යුතු කරුණු

**ජන:19**- අපගේ සහකාර සංස්කරුවන් හා ඔවුන්ගේ පවුල් වලට ආශිර්වාද කළ නිසා ප්‍රශංසා කරන්න.

**ජන:20**- අපගේ යාච්ඤා හවුල්කරුවන්, දායක හවුල්කරුවන්, ඇදහිල්ලේ හවුල්කරුවන්, ජීවිත කාලය පුරාම හවුල්කරුවන් සහ ඔවුන්ගේ පවුලේ පවුල් වලට දෙවියන් වහන්සේගේ දයාව හා කරුණාව තැබූ නිසා ස්තුතිය කරන්න.

**ජන:21** - පසුගිය මාසයේ අපගේ සියලුම මූල්‍ය හා අධ්‍යාත්මික අවශ්‍යතා සපුරාලීම නිසා දෙවියන්වහන්සේට ස්තුති කරන්න.

**ජන:22**- අපගේ සභාව සහ ශාඛා සභාවන්වල සිටින්නාවූ ඇදහිලිවන්තයන්ට ආශිර්වාද කළ නිසා ස්තුත් කරන්න.

**ජන:23**- දේවධාර්මික සම්මන්ත්‍රණයන් නිතිපතා පැවැත්වීමට අපිට හැකියාව ලබා දීම නිසා ස්තුති කරන්න.

**ජන:24**- අපගේ සභාවේ සහ ශාඛා සභාවල පැවැත්වූ නත්තල් සහ අලුත් අවුරුදු සැමරීමරීමේ උත්සවය ඉතා අර්ථවත්ව හා බලපෑමකින් යුතුව සැමරීමට අපට ඉඩ සලසා දුන් නිසා නිසා ස්තුති කරන්න.

**ජන:25**- ශාන්ත පාවුළු මෙට්‍රිකියුලේශන් පාසල නෙහෙමියා බයිබල් විදුහල සහ තැපැල් මාර්ගික දේව ධර්ම පාඨමාලාවේ සියලුම ක්‍රියාකාරකම් නිසා ස්තුති කරන්න.

**ජන:26**- විවිධ සේවාවන් හරහා සුභාරංචිය ප්‍රකාශ කිරීමට අපගේ ප්‍රධාන දේවගැති තුමා දැක්වූ කැපවීම නිසා ස්තුති කරන්න.

**ජන:27**- දේව වචනය ළඟා නොවූ පුද්ගලයින් වෙතට ළඟා වීමට අපගේ මිනිත්තු 5 ක කෙටි පණිවිඩය youtube චැනලය හරහා බෙදාහැරීමට ආශිර්වාද කළ නිසා ස්තුති කරන්න

**ජන:28**- භාෂා16 කින් නිකුත් කරන අපගේ සඟරාව බෙදාහැරීමට එය මුද්‍රණය කරන මුද්‍රණාලයටත් සහ එය බෙදාහැරීමට සඳහා කළ සියලුම ආශිර්වාදයන් නිසා ස්තුති කරන්න

**ජන:29**- අපගේ කැඳවීමේ ප්‍රතිරාවය සඟරාවේ කාර්ය මණ්ඩලයට සහ ඔවුන්ගේ පවුල්වලට යහපත් සෞඛ්‍යයක් සහ දිව්‍යමය ආරක්ෂාවක් ලබා දුන් නිසා ස්තුති කරන්න.

**ජන:30**- අපගේ සම්බන්ධීකාරවරුන්ට විවිධ පළාත්වල සිටින මිෂනාරිවරුන්ට සහ ඔවුන්ගේ පවුල්වලට ආශිර්වාද කළ නිසා ස්තුති කරන්න.

**ජන:31**- අපගේ දේවගැතිවරුන්ට සහ ප්‍රධාන සභාවේ සහ ශාඛා සභාවල ශ්‍රේෂ්ඨ නායකයින්ට ආශිර්වාද කළ නිසා ස්තුති කරන්න.

**පෙබ:01**- අපගේ රෝහල් සේවය තුළ දෙවියන් වහන්සේ කළා වූ සියලුම හාස්කම් නිසා ස්තුති කරන්න.

**පෙබ:02**- අපගේ ප්‍රධාන සභාවේ පුරුෂ සේවයට කළා වූ ආශිර්වාද නිසා ස්තුති කරන්න.

**පෙබ:03**- අපගේ තරුණ සහ ළමා ආරක්ෂණ සේවයේ ගෝලීය දැක්මට කළා වූ ආශිර්වාද නිසා දෙවියන්වහන්සේට ස්තුති කරන්න.

## යාච්ඤා කිරීම් සඳහා කරුණු

**පෙබ:04**- ලෝකයේ සියලුම රටවල් තුළ නූතනයේ ව්‍යාප්ත වී පවතින බෝවන රෝග තුරන් වන පිණිස යාච්ඤා කරන්න

**පෙබ:05**- අපගේ කැඳවීමේ ප්‍රතිරාවය සේවයේ තරුණ සේවය උදෙසා යාච්ඤා කරන්න.

**පෙබ:06**- මෙම නව වර්ෂයට කැඳවීමේ ප්‍රතිරාවය සේවය සඳහා අවශ්‍ය මූල්‍යමය ප්‍රතිපාදන උදෙසා යාච්ඤා කරන්න.

**පෙබ:07**- ලොව පුරා සිටින්නා වූ කාන්තාවන් හා දරුවන්ගේ ආරක්ෂාව නිසා යාච්ඤා කරන්න.

**පෙබ:08**- මිෂනාරිවරුන්ට හා දෙවියන් වහන්සේගේ සේවකයින්ට එරෙහිව තිබෙන්නා වූ ප්‍රචණ්ඩත්වය නැවැත්වීම පිණිස යාච්ඤා කරන්න.

**පෙබ:09**- අපගේ ජ්‍යේෂ්ඨ දේවගැතිතුමා වන පාස්ටර් සැම් සිල්වරාජ් සහ ඔහුගේ පවුලේ සාමාජිකයින්ව සියලුම ආකාරය දුෂ්ඨ බලවේග වලින් ආරක්ෂා කරන පිණිස යාච්ඤා කරන්න.

**පෙබ:10**- ඊශ්‍රායලය, පලස්තීනය, රුසියාව හා යුක්රේනය යන රට වලට සාමය ලැබෙන පිණිස යාච්ඤා කරන්න.

**පෙබ:11**- රජයේ විභාගයට සූදානම් වන සිසුන් නිසා යාච්ඤා කරන්න.

**පෙබ:12**- අපගේ ශාන්ත පාවුළු මෙට්‍රිකියුලේෂන් පාසලේ සහ නෙහෙමියා බයිබල් විදුහලේ ශිෂ්‍යයින්ගේ ආරක්ෂාව නිසා යාච්ඤා කරන්න.

**පෙබ:13**- අපගේ කාර්යාලයේ කාර්ය මණ්ඩලයේ හා මුද්‍රණාලයේ සේවය කරන්නා වූ සියලු දෙනාට යහපත් සෞඛ්‍යයක් ලබා දෙන පිණිස යාච්ඤා කරන්න.

**පෙබ:14**- අපගේ සහකාර සංස්කරුවන් හා ඔවුන්ගේ පවුල් නිසා යාච්ඤා කරන්න.

**පෙබ:15**- දෙවියන් වහන්සේගේ රාජ්‍යය මේ පොළොවෙහි ගොඩනගන පිණිස අපට නිවැරදි දර්ශනයක් ලබාදෙන පිණිස යාච්ඤා කරන්න.

**පෙබ:16**- විවිධ රෝගවලින් දිළිඳුකමින් හා දුප්පත්කමින් පීඩා විඳින්නා වූ මනුෂ්‍යයන් උදෙසා යාච්ඤා කරන්න.

**පෙබ:17** - මත්පැන් වලට ඇබ්බැහි වූ හා නොයෙකුත් නපුරු ක්‍රියාවන්ට ඇබ්බැහි වූ අය වෙතට ගොස් ඔවුන් හමුවී ඔවුන්ව පසුතැවිල්ලට ගෙනෙන පිණිස යාච්ඤා කරන්න.

**පෙබ:18** - මුළු ලෝකය පුරාම සාමය පැතිරෙන පිණිස යාච්ඤා කරන්න.

....Contd. from page 4

***ප්‍රිය මිත්‍රවරුනි,*** සමහර විට ඔබගේ ජීවිතයේ ඔබට අසාධාරණයක් වෙන්නට ඇත. වේදනාකාරී අත්දැකීම් තුළින් යන්නට ඇත. මිනිසුන් ඔබව නොසලකා ඔබට යෝසෙප්ට මෙන් හිරිහැර කරන්නට ඇත. නමුත් එක දෙයක් මතක තබා ගන්න. ඔබගේ මැවුම්කාරයා ඔබගේ ජීවිතය පාලනය කරමින් සිටි.

යෝසෙප් වරක් හිරගෙදරදී රජතුමාගේ කුසලානය දරන්නාට පැවසුවේ ඔබ රජතුමා ළඟට යන විට මාව සිහි කරන්න කියාය. ඔහුව හිරගෙදරින් නිදහස් කිරීමට ඔහුට හැකිය කියා යෝසෙප් සිතුවේය. නමුත් දෙවියන් වහන්සේ සෑම බාධාවක්ම ඉවත් කරයි. දෙවියන් වහන්සේ වැසූ දොරක් ඇරීමට කිසි මනුෂ්‍ය බලයකට නොහැකිය. එසේම දෙවියන්වහන්සේ අරින දොරවල් උන්වහන්සේගේ නියමිත වේලාවට අරින බව අපි දැනගනිමු. ***"උන්වහන්සේ සියලු දේම ඒ ඒ කාලයට සුදුසු ලෙස සලස්වා තිබේ......" (දේශනාකාරයා 3:11)***

ඔබගේ ජීවිතයේ සෑම අවස්ථාවේදීම ඔබගේ මැවුම්කාරයාව සිහි කරන්න. උන්වහන්සේ ඔබගේ හිස ඔසවන්නා වූ උන්වහන්සේගේ සැලැස්ම ඔබගේ ජීවිතයෙහි ඉෂ්ට කරන්නා වූ දෙවියන් වහන්සේය. උන්වහන්සේ තුළ සම්පූර්ණයෙන් විශ්වාසය දමන්න. උන්වහන්සේ අප ගැන නිතරම සිහිකරයි.

***''මා විසින් නුඹලා ගැන කරන යෝජනා මමම දනිමි. නුඹලාට මතු කාලයේදී බලාපොරොත්තුවක් දීමට ඒවා විපත්තියේ නොව සමාදානයේ යෝජනා යයි ස්වාමීන් වහන්සේ කියන සේක." (යෙරමියා 29:11)***

යෝසෙප්ව ඔහුගේ සහෝදරයන් පාලු ළිඳකට දැමූ විට ඔහුට කිසිම බලයක් නැතිව තිබෙන්නට ඇත. ''මට අනාගතයක් නැත." කියා ඔහු සිතන්නට ඇත. සිතා බලන්න, ඔහුව සිරගෙදරට දැමූ විට ඔහුට විරුද්ධව බොරු චෝදනා නගමින් රජුගේ උසස්ම නිලධාරින් ඔහුව සිරගෙදරට දැමූ විට ඔහු සිරගෙදරින් එළියට පැමිණීම අසාමාන්‍ය දෙයක් ලෙස තිබුණි. රජුගේ බලධාරීන් සමඟ සටන් කිරීමට කාට පුළුවන්ද?

නමුත් මෙවැනි සෝදිසි තුළදී පවා දෙවියන් වහන්සේ ක්‍රියා කළේය. බලාපොරොත්තු නොවන අන්දමින් දෙවියන්වහන්සේ පාරාවෝ රජතුමාව පාවිච්චි කරමින් යෝසෙප්ව සිරගෙදරින් එළියට ගෙන එම රටේ උසස් තනතුරකට පත් කරනු ලැබීය. නමුත් මේ සියල්ල එක රාත්‍රියකදී සිදු වූයේ නැත. මේ තුළින් ඔහු වසර ගණනාවක් පුරාම දෙවියන්වහන්සේ තුළ මුළුමනින්ම විශ්වාස කිරීමට ඉගෙන ගත්තේය.

මෙම දෙවියන් වහන්සේ මේ වසරේදිත් එකාකාරමයි. ඔබව උසස් කරන පිණිසත් ඔබගේ බලාපොරොත්තුව වැඩි කරන පිණිසත් නිසි මනුෂ්‍යයන් දෙවියන් වහන්සේ ඔබගේ ජීවිතයට ගෙනෙන්නට හැකිය උන්වහන්සේ උන්වහන්සේගේ මහිමය හා තේජස ඔබගේ හිස මතට පැමිණෙනු ඇත. ඔබගේ තත්ත්වය කුමක් වුවත් ඔබ ගමන් කරන මාර්ගය කොතරම් දුෂ්කර අමාරු වුවත් ඔබගේ මැවුම්කාරයාව විශ්වාස කරන්න ඔබ සිතනවාටත් වඩා අසනවාටත් වඩා මහත් දේ කිරීමට දෙවියන් වහන්සේට හැකිය.

## (3). ඔබට සපයන්නාවූ තැනැත් වහන්සේව සිහි කරන්න!

***''මාගේ බල පුළුවන් කමිනුත් මාගේ බාහු ශක්තියෙනුත් මේ වස්තුව ලද්දෙමැයි නුඹේ සිතින් නොකියන හැටියටද බලාගනින්න. නුඹේ දෙවි වූ ස්වාමීන් වහන්සේ සිහි කරපන්න. මක්නිසාද නුඹේ පියවරුන්ට දිවුල තමන්ගේ ගිවිසුම අද තිබෙන්නාක් මෙන් ඉෂ්ට කරන පිණිස නුඹට සම්පත් ලබාදීමට පුළුවන්කම දෙන්නේ උන්වහන්සේය."***
***(ද්වීතීය කතාව 8:17-18)***


ද්වීතිය කතාව 8 වන පරිච්ඡේදය මගේ ජීවිතයේ ඉතාම ආශා කරන්නාවූ බයිබල් පරිච්ඡේදයකි.

අපට තිබෙන්නා වූ සෑම දේම එනම් බලය ශක්තිය ප්‍රඥාව සාර්ථකත්වයේ යන සෑම දේම දෙවියන් වහන්සේගෙන් පැමිණෙන බව අපට මතක් කර දෙයි. එසේම උඩඟුකම, පාරටු කිරීම හා අපට සපයන්නා වූ දෙවියන් වහන්සේ ගැන අමතක කිරීම ගැන අපට අවවාදයක් දෙයි.

මෙම පදයෙන් උන්වහන්සේ අපට පවසන්නේ ඔබගේ සිතිවිලි හරහා ඔබ මේ ආකාරයෙන් පවසනවා කියාය. එනම්; දෙවියන් වහන්සේ අපගේ හදවත ගැනත් අපගේ සිතිවිලි ගැනත් අපගේ ක්‍රියාවන් ගැනත් උන්වහන්සේ දන්නා බවයි. එබැවින් උන්වහන්සේගේ හදවතට විරුද්ධව ඇති සිතුවිලි වලට අවවාදයක් දෙයි.

ඔබ මෙම නව වසරට පා තබන විට ඔබගේ ජීවිතයේ සියලුම අවස්ථාවන්වලදී ඔබගේ මැවුම්කාරයාව සිහි කරමින්ද යේසුස් ක්‍රිස්තුස්වහන්සේ මනුෂ්‍යයින් 5000කට රොටී පහයි මසුන් දෙකක් සමග කළ හාස්කම සිහි කරමින්ද

උන්වහන්සේ ඔබගේ සියලුම අවශ්‍යතා සපයන බව විශ්වාස කරන්න.



සමහර විටදී ඔබ මේ නව වසර බොහෝ අභියෝගවලට මුහුණ දී සටන් කරනවා ඇත. තවද ඔබගේ නිවසේ අයටත් ඔබගේ අනාගතයටත් සෑම දේම සපයන්නේ කවුද? කියන අමාරුකම තුළ සිටිනවා ඇත. දෙවියන් වහන්සේගේ හඬ ඔබගේ හදවත තුළ රැව් දේවා! එනම්; දෙවියන් වහන්සේ පවසන්නේ "මම නුඹට සපයන්නාවූ දෙවියන්වහන්සෙයි. බිය නොවන්න. පිටි ටිකකින් හා තෙල් ටිකකින් ආහාර හිඟ වූ අවස්ථාවේදී වැන්දඹු ස්ත්‍රියටත් ඔහුගේ පුතාටත් සියල්ල සැපයූවා නම් මම නුඹටත් සියල්ල සපයමින් ඔබව රැකබලා ගන්නෙමි.

## (4). ඔබගේ සබත් දවස සිහිකරන්න!



New Testament Christians traditionally celebrate Sunday!

සබත් දවස ගැන දීර්ඝ තර්කානුකූල දේ තිබේ. සත්වන දවස සබත් දවස කියා සමහරු පවසයි. අලුත් ගිවිසුමෙහි කිතුනු අය සම්ප්‍රදානුකූලව ඉරුදින දෙවියන්වහන්සේගේ දවසය කියා සමරනු ලැබීය. බොහෝ රටවල් යේසුස්වහන්සේ මළවුන්ගෙන් නැගිටි දවස වන ඉරුදින බැවින් එම දවස ශුද්ධ දවසක් ලෙස සලකයි. මැද පෙරදිග රටවල සිකුරාදා දින සබත් දවසය කියා සමරයි. ඔබ එවැනි රටක සිටී නම් සිකුරාදා දේවස්ථානයට යන එක සාමාන්‍ය පුරුද්දකි. මගේ කාරණය නම් ඔබ; සබත සිකුරාදා, සෙනසුරාදා හෝ ඉරිදා සමරනු ලැබුවත් එම දවස දෙවියන් වහන්සේගේ දවසයි කියා පවිත්‍රව සමරන්න. දේව වචනය මෙසේ පවසයි; ***"......එහෙයින් ස්වාමීන් වහන්සේ සබත් දවසට ආශිර්වාද කොට එය විශුද්ධ කළ සේක." (නික්මයාම 20:11)*** එහෙයින් ස්වාමීන් වහන්සේ සබත් දවසට ආශිර්වාද කොට එය විශුද්ධ කළ සේක.

මෙම කොටසින් දෙවියන් වහන්සේ අපට පවසන්නේ සබත් දවසේ දී උන්වහන්සේට මුල් තැන දෙන්න කියාය. දෙවියන්වහන්සේ සමඟ වැඩි වෙලාවක් ගත කරමින්ද එම දවසේ දී උන්වහන්සේට නමස්කාර කිරීමටත් දෙවියන් වහන්සේ උදෙසා පාවිච්චි කිරීමටත් යොදාගත යුතු බවත්ය.

සමහරු සබත් දවස ගැන වැරදි අර්ථකථනයන් දෙයි. සබත් දවසේදී නිවාඩු ගන්නය කියා පවසන්නේ එදින අප සභාවට නොගොස් නිවසට වී නිවාඩුව සිටිමින් නිදාගන්න ඕනි කියාය. නමුත් මිත්‍රවරුනි, මා ඉතා යටහත් පහත් කමින් ඔබගෙන් ඉල්ලන්නේ; දෙවියන් වහන්සේට අයිති දේ දෙවියන් වහන්සේට දෙන්නය කියාය. ***"......එබැවින් කායිසර්ගේ දේ කායිසර්ටත් දෙවියන් වහන්සේගේ දේ දෙවියන් වහන්සේටත් දීපල්ලා." (මතෙව් 22:21)*** සතියේ එක් දිනක් දෙවියන් වහන්සේට අයිතිය. එය සොරකම් නොකරන්න.

....Contd. to page 9

NEHEMIAH BIBLE COLLEGES,
Chepauk & Santhoshapuram, Velachery Chennai.
Qualification : 10th Standard & above
ECHO OF HIS CALL 1968-2018 REACHING NATIONS
Rush for admission! Medium :Tamil (Part Time)
Diploma in Theology Hindi (Residential) (Sponsorship Available)
Recognised by
International Christian Leaders &
Senior Pastors for the past 55 years
Contact : The Chairman, Nehemiah Bible College.
10, MOHAMMED ABDULLAH 2ND STREET, CHEPAUK, CHENNAI - 600 005, INDIA.
Phone : (+91-44) 2852 8282, Cell : (+91) 98410 71852 / 95661 31858
E.mail : sam@echoofhiscall.org / Website : www.echoofhiscall.org



# PIT TO PALACE

## පාලු වලකින් මාලිගාවට

**“...කියවන්නා තේරුම් ගනීවා....”** *(මතෙව් 24:15)*

**“ස්වාමීන් සොයන්නන්ට කිසි යහපත් දෙයකින් ඉගියක් නොවන්නේය...” (ගීතාවලිය 34:10)**

...Those who seek the LORD shall not lack any good thing. – Psalm 34:10.

1969 වන වර්ෂයේදී කැඳවීමේ ප්‍රතිරාවය සේවය ආරම්භ කළ දා සිට අපට බොහෝ ආර්ථිකමය අවශ්‍යතා තිබුණි. මෙම විවිධාකාර වූ සේවය කරගෙන යාමටත් සේවය කරන්නා වූ අයට වැටුප් කිරීමටත් මුද්‍රණය කිරීමට අවශ්‍ය කඩදාසි ලබාගැනීමටත් තැපැල් මාර්ගික පාඩම් මාලාවන් සඳහා අවශ්‍ය මුද්දර ගාස්තු වලටත් දුරකථන බිල්පත් විදුලි බිල්පත් ගොඩනැගිලි වලට ගෙවිය යුතු මුදල් ප්‍රවාහන පහසුකම් හා සමාජයේ විවිධ සේවයන් සඳහා අපට මුදල් අවශ්‍යතාවයන් බොහෝමයක් තිබුණි.

මා පුද්ගලික ලෙස පැවසූ දේ නම්; ස්වාමී වූ යේසුස්වහන්සේ මට සෑහෙයි යන්නයි. කිසිවෙකුගේ නිවසට ගොස් හෝ කාර්යාලයකට ගොස් තට්ටුකර මා මුදල් ඉල්ලා නොමැත. මගේ සභාවේ සිටින්නා වූ සාමාජිකයින්ගෙන්වත් මිත්‍රයින්ගෙන්වත් මා මූල්‍යමය ලෙස කිසිවක් ඉල්ලා නොමැත. මේ දක්වා මා කැඳවූ දෙවියන්වහන්සේ ඉතා පුදුමාකාර ලෙස මගේ අවශ්‍යතා සපයා දුන් සේක.

අවශ්‍යතාවයන් හා අමාරුකම් තිබෙන්නා වූ අවස්ථාවන්වලදී මා දෙවියන් වහන්සේ ඉදිරියට ගොස් උන්වහන්සේ සමඟ කතා කිරීමට කාලයක් වෙන් කරමින් උන්වහන්සේ සමඟ ඉතා හොඳ සම්බන්ධතාවයක් යාඥාව තුළින් ගත කිරීමට පුරුදු පුහුණු විය. ඒ කරණ කොට ගෙන මට පුදුමාකාර භාස්කම් හා අත්දැකීම් ලැබුණි . මෙවැනි අවස්ථාවන්වලදී මා නොදන්නා වූ මිනිසුන් තුළින් මට බොහෝ උදව් උපකාර ලැබුණෝය. මා නොදන්නා වූ අය තුළින් මටද මගේ පවුලට ද සෑම දේම දෙවියන් වහන්සේ සැපයූ සේක.

1975 වන වර්ෂයේදී කැඳවීමේ ප්‍රතිරාවය මුද්‍රණය කළාවූ ජී නමැති මුද්‍රණාලයට ඉන්දියානු මුදලින් රුපියල් 300ක මුදලක් ගෙවීමට වරක් මා හට අසමත් විය. මන්ද ඒ වන විටදී මා අත කිසිදු මුදලක් නොතිබුණ නිසා මේ මුදල ගෙවීමට ප්‍රමාද විය. මම එම කාර්යාලයට ගොස් එහි කළමනාකරුට කතා කොට මෙම මුදල මම සඳුදාට ගෙවන්නෙමි කියා පැවසුවෙමි. නමුත් එය ගෙවන පිණිස මට කිසිම මුදලක් නොතිබුණු නිසා මගේ අවශ්‍යතාවය දෙවියන් වහන්සේට භාරදී නිහඬව සිටියෙමි. ඉරිදා වන තුරුම මට එම මුදල ලැබුණේ නැත.

නමුත් සඳුදා උදෑසන මා තැපැල් තැපැල් කාර්යාලයට ගොස් මගේ තැපැල් පෙට්ටිය විවෘත කළ විටදී එහි ලියුම් කවරයක් තිබුණි. එය දකුණු ඉන්දියාවේ මදුරෙයි අසල තිබෙන්නා වූ නාග ලම්පුරම් යන කුඩා ගම්මානයේ සිට එම ලිපිය එවා තිබුණි. මා එය විවෘත කළ විටදී එහි ඇතුළත රුපියල් 300ක චෙක් පතක් තිබුණි. එම දවසට මගේ අවශ්‍යතාවය සපුරා ගැනීමට එම මුදල සෑහුනේය. මම එම මුද්‍රණාලයට පොරොන්දු වූ පරිදි එම මුදල ගෙව්වෙමි. දෙවියන් වහන්සේට මහිමය වේවා!



මෙම සිදුවීම සිදු වී බොහෝ වසර ගණනකට පසුව මා නාගලම්පුරම් යන ගම්මානයට ගොස් එම තැනැත්තා බැලීමට ගියෙමි. මා එම තැනැත්තා දැක ඉතා පුදුමයට පත්වුනෙමි. මන්ද ඔහු ඉතා දුප්පත් සපත්තු මසන්නෙකි. ඔහු මා දැක ඉතා සතුටට පත්වී මට මෙසේ පැවසුවේය; ''එදා බ්‍රහස්පතින්දා දවසකි. කවුදෝ කෙනෙක් මගේ හදවතට කතාකර රුපියල් 300ක් කැඳවීමේ ප්‍රතිරාවේ සේවයට දෙන්නේ කියා පැවසුවේය. එවිට මා අත තිබුණේද එපමණයි. නමුත් මා සිකුරාදා දින එම මුදල ඔබට තැපැල් කළ අතර එය ඔබට සඳුදා දින ලැබුණෝය.''

මගේ ජීවිතයේ දෙවියන්වහන්සේ කළ භාස්කම් අතරින් මෙය ඉතා වැදගත් වූ භාස්කමකි.

අප ගමන් කරන්නාවූ මාර්ගය ඉතා අසීරු වෙන්නට පුළුවනි. නමුත් මා දෙවියන් වහන්සේගේ විශ්වාසවන්තකම ගැන සාක්ෂි දරමි. මන්ද ස්වාමීන් වහන්සේ මගේ එඬේරාය, මට ඉගියක් නොවන්නේය.

***"නුවණැත්තේ මේ දේ සිතට ගනියි......"***

***(ගීතාවලිය 107:43)***

*************


**Echo of His Call Postal Courses for candidates in India only**

**Pray for** BIBLECOR

We offer Postal Course on Basic Truths of The Bible to new Christians and non-Christians in English – 57 pages, Hindi – 76 pages & Tamil – 96 pages. You will get a course book entitled **New Life – For You!** **After the completion of this course, you will get a certificate. There will be no compulsory fees. You will be blessed!**

**The Chairman, Nehemiah Bible College,** Echo of His Call, Post Box 2957, CHEPAUK, CHENNAI - 600 005.

Ph.: (044) 2852 8282, 2852 9293, 2854 7766, Cell : 98410 71852, 95661 31858 E.mail : biblecor@yahoo.co.in

*7 පිටුවෙන්....*

අවාසනාවන්ත ලෙස අද බොහෝ අය උන්වහන්සේගේ දවසේදී උන්වහන්සේට ප්‍රමුඛස්ථානය නොදී ඔවුන්ගේ සෑම වැඩ කටයුත්තක්ම හමාර කර ඉන්පසුව කාල වේලාවක් තිබුණහොත් දෙවියන් වහන්සේට එම වෙලාව දෙනු ලබයි. ඒ සඳහා ඔවුන් නිදහසට කරුණු පවසනු ලබයි. එසේ ඔවුන්ගේ ප්‍රකාශයන් නම්;

''මම ඉරිදා වැඩ කළේ නැතිනම් මගේ බිල් ගෙවන්නේ කවුද?''

''මගේ පන්තිවලට යන්න තිබෙන්නේ ඉරු දින පමණයි.''

''මට තරඟයකට ඉදිරිපත් වීමට තිබෙනවා. ක්‍රීඩා දක්ෂතාවයන් මට දී තිබෙන්නේ දෙවියන් වහන්සේසෙයි.''

අද මෙවැනි කරුණු බොහෝ දෙනා පවසයි. අපි දෙවියන් වහන්සේට දිය යුතු දවස උන්වහන්සේට නොදී එයින් වැලකී සිටී. නමුත් දෙවියන් වහන්සේ මෙසේ පවසයි; ***''එහෙයින් නුඹලා කතත් බොතත් වෙන යමක් කරතත් සියල්ල දෙවියන්වහන්සේගේ ගෞරවය පිණිස කරපල්ලා.'' (1 කොරින්ති 10:31)*** අද අප සැබැවින්ම දෙවියන් වහන්සේව මහිමයට පත් කරනවාද?

**(5). ඔබ වැටුණු තැන කොතැනද කියා සිහිකරන්න!**

දේව වචනය අපට අවවාදයක් දෙයි.

***''එබැවින් නුඹ වැටී සිටින්නේ කොතැනින් දැයි සිහිකොට පශ්චත්තාපව, පළමු ක්‍රියාවන් කරපන්න; නැතහොත් මම නුඹ ළඟට ඇවිත්, නුඹ පශ්චත්තාප නොවනවා නම් නුඹේ පහන් රුක ස්වකීය ස්ථානයෙන් අහක් කරන්නෙමි.'' (එළිදරව් 2:5)***



**Repent and turn back to Me!**

මෙම නව වසර ආරම්භයේදීම අපගේ ජීවිතය සෝදිසි කර බලමු. අපි වැටී සිටින්නේ කොතැනද? අපි කරන දේවල් නිවැරදිව කළ යුත්තේ කොතැනද? දෙවියන් වහන්සේ අපව ඉතාම ආදරයෙන් උන්වහන්සේ වෙතට නැවත හැරෙන්නේ කියා කතා කරයි.

අප උන්වහන්සේ වෙතට පැමිණෙන තුරු උන්වහන්සේ තම දෑත් දිගු කර ඔබ එනතුරු බලා


**Pray for IMMEDIATE REQUIREMENT**

**ECHO OF HIS CALL is expanding at a fast pace. We need mission minded, dedicated and faithful men and women candidates for the following positions:**

- Full time Assistant Pastors for our Main Church
- Full time Assistant Pastors for our Branch Churches in Chennai
- Full time security personnel
- DTP Operators and Typists
- Candidates with proficiency in speaking and writing English and other languages
- Managers and Co-ordinateors interested in School & Office Administration
- Full time Bible College Lecturers
- Volunteers who can promote our ministry in cities & villages
- Hon. Co-ordinators to serve in Editorial Board of **Echo of His Call**
- Full time Drivers
- Principal and Teachers for Matriculation School
- Full time female cooks
- Full time housekeeping employees

**Salary based on qualification and experience.**

Please Contact **ECHO OF HIS CALL** office
**Apply at Whatsapp No : 98412 71858**
**Email : sam@echoofhiscall.org**

RNI NO. TN/SIH/2006/17846

සිටී. උන්වහන්සේගේ ප්‍රේමයේ බලාපොරොත්තුවෙන් ඔබගේ හදවත පුරවා ගන්න. අපි උන්වහන්සේගේ ප්‍රේමයට කරුණාවට හා දයාවට නොවටින්නාවූ කෙනෙක්ය කියා සිතන්නට පුළුවන. නමුත් ඔබ මේ දේ මතක තබාගන්න. දෙවියන් වහන්සේ යේසුස් ක්‍රිස්තුස් වහන්සේව කුරුසියට යවනු ලැබුවේ අප සැම දෙනාටම උන්වහන්සේගේ කරුණාව අත්‍යාවශ්‍ය නිසාය. උන්වහන්සේ නොමැතිව අපට කිසි දෙයක් කිරීමට නොහැකිය.

උන්වහන්සේ අපගේ පව් වලට කමාව දීමට සූදානම්ය. අපගේ කැඩුනාවූ බිඳුනා වූ ජීවිතයට අලුත් දෙයක් කිරීමට ද උන්වහන්සේ සූදානමින් සිටී. ප්‍රශ්නය නම් අප අපගේ කැඩුණාව බිඳුනා වූ හදවත උන්වහන්සේට භාරදීමට කැමතිද? යන්නයි. අපි එසේ කරනවා නම්; උන්වහන්සේ අපට කරන්නා වූ අලංකාර දේ අත්දකිමු.

ස්වාමී වූ යේසුස් වහන්සේ තුළ ඉතා අනර්ඝ ආශිර්වාදමත් ඵලදායී නව වසරක් භුක්ති විඳින්න. ඔබගේ ජීවිතය කරනකොට ගෙන බොහෝ අයගේ ජීවිතවලට ඔබ ආශිර්වාදයක් විය යුතුය. ඔබ තුළ තිබෙන ආලෝකය අන් අයට විහිදුවමින් මේ ලෝකයේ තුළ වෙනසක් ඇති කරන්නයි කියා මා යාච්ඤා කරමි.

************


## Echo of His Call

**YouTube**
Please subscribe

Kindly view and subscribe our Echo of His Call YouTube Channel when you get time. Thanks.

- Editor


# ECHO OF HIS CALL

Monthly magazines in 16 languages, Bible Colleges, Postal Courses, Church Planting, Village English High School, Gospel Printing Press, Crusades, Seminars, Social Services, etc.

**Annual Subscription : Rs. 100/-** **Life Subscription : Rs. 2000/-**

The multifarious activities of **Echo of His Call Ministries** are supported by the free-will offerings and donations of God's children like you. You may support **Echo of His Call** and its activities as the Lord leads you. We need your help to send forth the Gospel to the unreached people and plant Churches.

If you would like to receive **ECHO OF HIS CALL** magazines regularly, please write to us with your e.mail Id and Cell Phone number. Whenever you change your postal or e.mail addresses, please do inform us your old and new addresses.

**Echo of His Call** is available in 16 languages in our website also. You can read them by going into the site as well as downloading them and get blessed.

Your letters, prayer requests and your financial helps (**Money Orders, Cheques or Demand Drafts, NEFT, PayPal (Sam Selva Raj, sam@echoofhiscall.org) PhonePe (98410 71858), Gpay (98410 71858), Western Union, MoneyGram, etc.**) to **ECHO OF HIS CALL** may please be sent to the address below.

Please send your **Land Phone / Mobile Phone Numbers and E.mail addresses** for updation.


Our address :

**ECHO OF HIS CALL**

10, MOHAMMED ABDULLAH 2ND STREET, CHEPAUK, CHENNAI - 600 005, INDIA

PH.: (+91-44) 2852 8282, 2852 9293, 2854 7766/ Cell: (+91) 98410 71852, 95661 31858 / E.mails: sam@echoofhiscall.org / biblecor@yahoo.co.in

Websites: www.echoofhiscall.org / www.stpaulsmatriculation.com



**Regd. with the Registrar of Newspapers for India under No. TN/SIH/2006/17846**

**Date of Publication: First week of every month**

**Date of Posting : 1st & 2nd of every month**

**Posted at "Egmore RMS / 1 Patrika Channel"**

**on 2nd JANUARY 2025.**

**If un-delivered please return to:**

**ECHO OF HIS CALL (SINHALA)**

**P.O. Box No. 2957,**

**Chepauk, Chennai - 600 005, INDIA.**

**Phone: (+ 91- 44) 2852 8282, 2852 9293, 2854 7766**


***JESUS LOVES YOU!***

**To**

***GOD BLESS YOU!***

Owned and published by **S. Sam Selva Raj** from New No. 8 & 10, Old No.18 & 19, Mohammed Abdullah 2nd Street, Chepauk, Chennai-600 005 and printed by **S. Sam Selva Raj** at **Echo of His Call Printers**, New No. 8 & 10, Old No.18 & 19, Mohammed Abdullah 2nd Street, Chepauk, Chennai-600 005. Editor: **S. Sam Selva Raj.**